**ජාතික රක්ෂණ භාර අරමුදල - 2013**
**-------------------------------------**

ජාතික රක්ෂණ භාර අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ13(1) වගන්තිය සහ 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනතේ 17 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 අභිතකර මතය සඳහා පදනම

**----------------------------------**

මෙම වාර්තාවේ 2.2.3 (අ), (ආ) සහ 2.2.5 ඡේදවල දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 අහිතකර මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට ජාතික රක්ෂණ භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිලිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන පනත ප්‍රකාරව, 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වෙමින් පිළියෙල කළ යුතු වුවද, මූල්‍ය ප්‍රකාශන ඊට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කර නොතිබූ අතර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට සංක්‍රාන්ති වීමක් සිදු වී නොතිබීම හේතුවෙන් මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම්, සාධාරණ වටිනාකමකට වර්ගීකරණය හා ධාරණ වටිනාකම අනුව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 අනුව අස්ථිත්වයක් විසින් ප්‍රමිතියක් මඟින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් සහ වගකීම් හිලව් නොකළ යුතු වුවද, බැංකු ගිණුම් 13 ක එකතුව රු.360,514,789 ක් වූ බැංකු ශේෂ බැංකු ගිණුම් 02 ක එකතුව රු.55,162,561 ක් වූ බැංකු අයිරා ශේෂවලට හිලව් කර දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 අනුව අරමුදල සතු දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, ඵලදායී ජීවිත කාලය අවසන් වී ඇති වර්තමානයේ භාවිතයට ගනු ලබන පිරිවැය රු.9,578,750 ක් වූ වාහන දෙකක ප්‍රත්‍යාගනිත වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

2012 වර්ෂය සඳහා පාරිතෝෂික වෙන් කිරීම් සිදුකර තිබුණේ වසර 5 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර තිබුණු නිලධාරීන් සඳහා පමණක් වුවද, 2013 වර්ෂයේ වසරක සේවා කාලයක් සම්පූර්ණ කර තිබුණු නිලධාරීන් සඳහා ද පාරිතෝෂික වෙන් කිරීම් කර තිබුණි. මේ හේතුවෙන් 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී පාරිතෝෂික වෙන් කිරීම්වල රු.5,072,504 ක වැඩිවීමක් නිරීක්ෂණය වුවද, පාරිතෝෂික වෙන් කිරීම් සම්බන්ධව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 8 හි 28 ඡේදය අනුව හෙළිදරව් කළ යුතු තොරතුරු කිසිවක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදල විසින් විදේශ රැකියාවල නියුක්ත වූවන් සඳහා හඳුන්වා දී තිබූ රක්ෂණ ක්‍රමය 2012 අප්‍රේල් 28 දින සිට නවතා තිබුණද, 2012 මැයි මාසයේ සිට 2014 අගෝස්තු මාසය දක්වා එම

රක්ෂණ ක්‍රමය වෙනුවෙන් එකතුව රු.219,928,591 ක් වූ වන්දි ඉල්ලීම් අනෙකුත් රක්ෂණ ක්‍රම යටතේ ලද වාරික ආදායම භාවිතා කරමින් ගෙවා තිබුණි.

(ආ) 2012 වර්ෂයේදී බැංකු ගිණුමක දෙසැම්බර් 31 දිනට පැවති රු.7,215,904 ක් වූ මුදල් පොතේ ශේෂය හා එදිනට රු.1,251,008 ක් ලෙස බැංකු සැසඳුම් ප්‍රකාශයේ සඳහන් මුදල් පොතේ ශේෂය අතර රු.5,964,896 ක වෙනසක් පැවති අතර, එම වෙනස සමාලෝචිත වර්ෂයේ දී සමුච්චිත අරමුදලට ගලපා තිබීම හේතුවෙන් සමුච්චිත අරමුදල රු.5,964,896 කින් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.4 නොසැසඳූ පාලන ගිණුම්

බැංකු ගිණුම් 4 ක ශේෂ පිරික්සුමේ/ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් බැංකු ශේෂ හා බැංකු සැසඳුම් ප්‍රකාශනවල සඳහන් ශේෂ අතර රු.38,500,000 ක හර හා රු.26,288,162 ක බැර ශේෂ වෙනස්කම් පැවතුණි.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා විගණනයේදී සත්‍යනිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | විෂය | වටිනාකම | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (i) | අනෙකුත් ලැබිය යුතු මුදල් | 871,139,458 | ශේෂ සනාථ කිරීමේ ලිපි විස්තරාත්මක උපලේඛන කාල විශ්ලේෂණ |
| (ii) | අනෙකුත් ගෙවිය යුතු මුදල් | 31,174,057 | |
| (iii) | ගෙවිය යුතු රක්ෂණ වන්දි | 273,060,335 | |
| (iv) | ඉතිරි කිරීමේ ගිණුම් | | |
| | මහජන බැංකුව | 20,404,203 | ගිණුම් පාස් පොත |
| | පැන් ඒෂියා බැංකුව | 1,191,137 | ගිණුම් පාස් පොත හා ශේෂ සනාථ කිරීමේ ලිපි |
| (v) | ජංගම ගිණුම | | |
| | මහජන බැංකුව | 22,913,768 | බැංකු සැසඳුම් ප්‍රකාශන |
| | මහජන බැංකුව | (54,516,844) | |
| | මහජන බැංකුව | 137,478,867 | ශේෂ සනාථ කිරීමේ ලිපි හා බැංකු සැසඳුම් ප්‍රකාශන |

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

අරමුදල යටතේ ක්‍රියාත්මක වන වැඩ වර්ජන , කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදි අරමුදලේ 2008 වර්ෂයට අදාලව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට ගෙවිය යුතුව තිබෙන ලාභ කොමිස් රු.12,287,375 ක් 2010 වර්ෂයේ සිට නිරවුල් නොකොට විගණිත දිනය වූ 2014 ඔක්තෝබර් 31 දින වන විටත් පැවතුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනතේ 6 (1) ඡේදය | සෞඛ්‍ය විෂයය පවරනු ලබන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයෙන් නිලධාරියෙක් පත් කළ යුතු වුවද, 2015 ජනවාරි 15 දින දක්වා එම නිලධාරියා පත්කර නොතිබුණි. |
| (ආ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14 පරිච්ඡේදය | අරමුදල විසින් පරිපාලන අත්පොතක් පිළියෙල කර අනුමත කරවා ගෙන නොතිබුණි. |
| (ඇ) | රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල / 01 හා 2010 දෙසැම්බර් 17 දිනැති ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා පසු වර්ෂයේ මාර්තු 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද වාර්තාව ඉදිරිපත් කර තිබුණේ 2014 දෙසැම්බර් 29 දිනදීය. |
| (ඈ) | 2011 සැප්තැම්බර් 15 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 58 (2) හි 3.1 ඡේදය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සඳහා දීමනා ගෙවීමේදී සියයට 10 ක රඳවා ගැනීමේ බදු අඩු කල යුතු බව සඳහන් වුවද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වෙත ගෙවනු ලබන දීමනාවෙන් එසේ අඩු කිරීම් සිදුකර නොතිබුණි. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 102/104 | අරමුදල විසින් 2013 ජූලි 15 දින සිදු කර තිබුණු භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වී තිබුණු අයිතම 69 ක ඌනතා සම්බන්ධව රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාකර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 371 (2) (ආ) | දෙන ලද අතුරු අග්‍රිමයන් එය දෙන ලද කාර්යය නිම කළ විගසම පියවිය යුතු වුවද, අවස්ථා 4 කදී ගෙවන ලද රු.23,000 ක් වූ අත්තිකාරම් පියවීම දින 30 ක පමණ කාලයක් ප්‍රමාද වී තිබුණි. |

(iii) මුදල් රෙගුලාසි 371 (5) ඡේදය

අතුරු අග්‍රිම ශේෂය පියවීම එම අග්‍රිමය නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දිනට වැඩියෙන් ප්‍රමාද නොකළ යුතු වුවත් අවස්ථා 7 ක දී දෙන ලද එකතුව රු.86,000 වූ අග්‍රිම ශේෂ 2013 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි.

(iv) මුදල් රෙගුලාසි 396 (ඈ)

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිකුත් කළ දින සිට මාස 6 ක් ඉක්ම වූ ඉදිරිපත් නොකළ රු.44,541,842 ක් වූ චෙක්පත් 20 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතුවලින් වූ මූල්‍ය ප්‍රතිඵලය රු.4,240,847,242 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,083,023,166 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,157,824,076 ක වැඩිවීමක් දක්නට ලැබුණි. මේ සඳහා රක්ෂණ වාරික ශුද්ධ ආදායම, අග්‍රහාර දායකත්ව ලැබීමේ හා වගා රක්ෂණ ආදායම පිළිවෙලින් රු.1,048,026,316 ක්, රු.543,271,321 ක් හා රු.440,836,600 ක වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

----------------------------------

අරමුදල යටතේ ක්‍රියාත්මක වන වැඩවර්ජන, කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදල සඳහා ලැබෙන ආදායම් අරමුදලේ ප්‍රධාන ආදායම් මූලාශ්‍රය වන අතර යුද්ධය අවසන් වීමත් සමඟ එම ක්‍රියා සඳහා වූ රක්ෂණ ආවරණය සඳහා ඇති ඉල්ලුම අඩුවීමත් එහි ත්‍රස්තවාදී ක්‍රියාවලට අදාළව අය කරනු ලබන ප්‍රතිශතය සංශෝධනය කිරීමත් සමඟ අරමුදල සඳහා ලැබෙන වාරික ආදායම 2010 වර්ෂයේ රු.3,926,469,856 ක් වූ අතර එම ප්‍රමාණය 2013 වර්ෂය වන විට රු.2,543,930,179 දක්වා ප්‍රමාණාත්මක ලෙස අඩු වී තිබුණි.

කොටස් ප්‍රාග්ධනයක් නොමැතිව ක්‍රියාත්මක වන මෙම අරමුදලෙන්, ඒකාබද්ධ අරමුදල සඳහා ලබා දී තිබූ දායකත්වය හේතුවෙන් සමුච්චිත අරමුදල් ශේෂය අඩුවීම සඳහා පිළියමක් ලෙස 2011 මාර්තු 11 දින පැවැත්වූ 58 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සමුච්චිත අරමුදල සඳහා රුපියල් බිලියන 10 ක වෙනමම සංචිතයක් පවත්වා ගත යුතු බවට තීරණය කර තිබුණි. එහෙත් පසුගිය වර්ෂ තුළදී එම සංචිතය හෝ සමුච්චිත අරමුදලේ අවම ශේෂය හෝ පවත්වා ගැනීමට අරමුදල අපොහොසත් වී තිබුණි. 2010 වර්ෂයේ සමුච්චිත අරමුදලේ රු.9,695,467,155 ක් වූ ශේෂය සමාලෝචිත වර්ෂය වන විට රු. 6,942,528,728 දක්වා අඩු වී තිබුණි.

**3.3** **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

---

2010 ජුලි 27 වන දින කොන්ත්‍රාත් පදනම මත සය මාසික කාලයක් සඳහා වයස අවුරුදු 68 ඉක්මවා තිබූ පුද්ගලයෙකු සහකාර කළමණාකරුවෙකු (විනය හා වන්දි විමර්ෂණ) ලෙස බඳවා ගෙන තිබුණි. 2010 ජුනි 22 දින පැවති සම්මුඛ මණ්ඩල නිර්දේශ මත කිසිදු නිවාඩුවක් හිමිනොවන පරිදි හා කාර්යය පැවැරුම් අනුව දීමනා ගෙවීම මත ඉහත කී පුද්ගලයා විමර්ෂණ නිලධාරියෙකු ලෙස බඳවා ගැනීම නිර්දේශ කර තිබුණි. එහෙත් රු.27,500 ක මාසික වැටුපක් සහ අනෙකුත් වරප්‍රසාද සපයමින් විධිමත් අනුමැතියකින් තොරව මෙම තැනැත්තා පරිපාලන හා මානව සම්පත් උපදේශක තනතුරකට බඳවා ගෙන තිබුණු අතර ඔහුගේ ඉල්ලීම් මත බඳවා ගත් දින සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා මාස 6 න් 6 ට කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

---

**4.1** **කාර්යසාධනය**

---

අරමුදල විසින් ක්‍රියාත්මක කර තිබූ එක් එක් අංශය මඟින් ඉටු කරන ලද කාර්යයන්වල ප්‍රගතිය පහත දක්වා ඇත.

(අ) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය යටතේ ලියාපදිංචි වී රැකියා සඳහා විදේශගතවන ශ්‍රී ලාංකිකයින් සඳහා අරමුදල විසින් රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දී තිබුණු අතර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ අරමුදල අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුමකට අනුව අරමුදල විසින් 2008 ජුනි 01 දින සිට 2012 අප්‍රේල් 28 දින තෙක් එය ක්‍රියාත්මකව පැවතුණි. මේ යටතේ එම කාලපරිච්ඡේදය තුළ එකතුව රු.247,378,731 ක ශුද්ධ ආදායමක් උපයා ගෙන තිබුණි. ගිවිසුමේ එක් පාර්ශ්වකරුවෙකු වන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් අදාළ ගිවිසුම අවසන් කරන බව 2012 මාර්තු 30 දින අරමුදලට දන්වා තිබීම මත මෙම රක්ෂණ ක්‍රමය මේ වනවිට නවතා දමා තිබුණි. කෙසේ වුවද, අරමුදලට වාසිදායක වන අයුරින් ක්‍රියාත්මක වූ මෙම රක්ෂණ ක්‍රමය ඉදිරියට පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් අදාළ පාර්ශ්වයන් සමඟ සාකච්ඡා කර අවශ්‍ය වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට අරමුදල කිසිදු උත්සාහයක් ගෙන නොතිබුණි.

(ආ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා සමූහ රක්ෂණ ක්‍රමයක් අරමුදල මඟින් හඳුන්වා දී තිබුණු අතර එහි වාර්ෂික රක්ෂණ වාරික මුදල් තීරණය කරනු ලබන්නේ අරමුදල විසින් වුවද, ඒ සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, 2012 හා 2013 වර්ෂවල අය කරනු ලැබූ වාර්ෂික රක්ෂණ වාරික මුදල ඉක්මවා එකතුව රු.7,898,710 ක ප්‍රතිලාභ ගෙවා තිබුණි.

(ඇ) වී ගොවින්ගේ වගාවන්ට නියඟයෙන්, ගංවතුරෙන් සහ වන අලින්ගෙන් සිදු වන හානිවලින් ආරක්ෂා කර ගැනීමේ අරමුණින් 2013 වර්ෂයේ අයවැය යෝජනාවක් අනුව අරමුදල විසින් වගා රක්ෂණය හඳුන්වා දී තිබුණු අතර මේ සම්බන්ධව අංක BD/FE/118/ 01/BP/2013 හා 2013 ජුනි 21 දිනැති අයවැය චක්‍රලේඛය මඟින් සියලුම වී ගොවින් රක්ෂණය වීම අනිවාර්යය කර තිබුණි. ගොවින් විසින් පොහොර මිලදී ගැනීමේ දී එයට අදාල වාරික මුදල් අයකර ගැනීම ගොවිජන සේවා මධ්‍යස්ථාන වලින් සහ සමුපකාර සමිති වලින් සිදු කරනු ලබන අතර එසේ අයකරනු ලබන මුදල් සතිපතා ජාතික රක්ෂණ භාර අරමුදලේ ගිණුමකට ප්‍රේෂණය කල යුතු වුවද, ගොවීන්ගෙන් අයකර ගනු ලබන සියලු මුදල් සතිපතා බැංකුගත කිරීමක් සිදු කරන්නේ දැයි තහවුරු කර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් අරමුදල හඳුන්වා දී නොතිබුණි. එසේම, මහා කන්නයේ නියඟයෙන් වගාවන්ට හානි සිදුවීම හේතුවෙන් 2014 සැප්තැම්බර් 16 දින වන විට අරමුදල වෙත ලැබී තිබුණු වන්දි ඉල්ලුම්පත්‍ර 68,359 කින් අයදුම්පත් 15,240 ක පමණක් ගෙවීම් අවසන් කර තිබුණු අතර තවත් අයදුම්පත් 53,119 ක

ගෙවීම් සිදු කිරීමට තිබීම හේතුවෙන් මෙම වගා රක්ෂණ ක්‍රමය කෙරෙහි තබා ඇති විශ්වාසය පළුදු වන බවත් එම නිසා මේ මගින් අපේක්ෂිත අරමුණු ඉටු නොවන බවත්, නිරීක්ෂණය විය.

(ඇ) අරමුදල විසින් ක්‍රියාත්මක කර තිබූ අග්‍රහාර රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ දී සහ දායක මුදල් අයකර ගැනීමේ දී විවිධ ආයතනවලින් කරනු ලබන ප්‍රේෂණයන්ගේ නිවැරදිතාවය තහවුරු කර ගැනීමේ විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණු අතර දායක මුදල් අප්‍රමාදව අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ද ගෙන නොතිබුණි. එසේම සේවා ආයතනවල නියුක්තිකයන් සියල්ලන්ම මෙම රක්ෂණ ක්‍රමය යටතේ සාමාජිකත්වය ලබා ගෙන ඇත්ද යන්න පරීක්ෂා කිරීමට අවශ්‍ය පියවරයන් ද ගෙන නොතිබුණි.

(ඉ) අරමුදල විසින් 2008 වර්ෂයේ සිට සියළු රජයේ ආයතන සතු මෝටර් වාහන රක්ෂණය ද 2009 සැප්තැම්බර් 01 දින සිට පෞද්ගලික වාහන රක්ෂණයක් ද ආරම්භ කර තිබුණු අතර 2009 සැප්තැම්බර් 18 දිනැති අංක PF 437 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සියළුම රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතන තම අවශ්‍යතාවයන් අනුව මෝටර් රථ රක්ෂණය ජාතික රක්ෂණ භාර අරමුදල හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙතින් පමණක් සලසා ගත යුතු බව පෙන්වා දී තිබියදීත්, එයට පටහැනිව 2013 පෙබරවාරි 18 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී රාජ්‍ය ව්‍යාපාර හැර අනෙකුත් ආයතනවල මෝටර් රථ රක්ෂණයට පමණක් මෙම රක්ෂණ කටයුතු සීමා කිරීමට තීරණය කර තිබුණි. විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, 2009 වර්ෂයේ සිට 2013 දක්වා රක්ෂණය කරන ලද රජයේ හා පෞද්ගලික වාහන සංඛ්‍යාව හා ඉන් ලද රක්ෂණ වාරික ආදායම සැසඳීමේදී 2009 වර්ෂයට සාපේක්ෂව 2013 දක්වා රක්ෂණය කරන ලද රජයේ වාහන සංඛ්‍යාව 7321 කින් එනම් සියයට 45 කින් හා වාර්ෂික ආදායම රු.මිලියන 158 කින් අඩු වී තිබුණු අතර රක්ෂණය කරන ලද පෞද්ගලික වාහන සංඛ්‍යාවද 2011 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී වාහන සංඛ්‍යාව 2736 කින් හා ආදායම රු.මිලියන 9 කින් අඩු වී තිබුණි.

## 4.2 කාර්ය මණ්ඩල පරිපාලනය

2013 දෙසැම්බර් 31 දිනට අරමුදලේ අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය හා පුරප්පාඩු සංඛ්‍යාව පහත පරිදි විය.

| විස්තරය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 12 | 02 | 10 |
| තෘතියික මට්ටම | 16 | 16 | 0 |
| ද්විතියික මට්ටම | 144 | 126 | 18 |
| ප්‍රාථමික මට්ටම | 24 | 18 | 06 |
| එකතුව | 196 | 162 * | 34 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දින වන විට අරමුදලේ මුළු පුරප්පාඩු සේවක සංඛ්‍යාව 34 ක් එනම් අනුමත තනතුරුවලින් සියයට 17 ක් විය. මේ තුළ අරමුදලේ ප්‍රධාන විධායක නිළධාරියාද ඇතුළුව ඉහල කළමනාකාරීත්වයේ තනතුරු 10 ක පුරප්පාඩු පැවතුණි .

(ආ) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අංක DMS /C2/2/44 හා 2012 සැප්තැම්බර් 07 දිනැති ලිපිය මගින් අරමුදල සඳහා වු සේවක සංඛ්‍යාව අනුමත කර තිබුණද, එදින සිට වර්ෂ 02 ක කාලයක් ඉක්ම වී ඇතත් ඉහත පුරප්පාඩු සඳහා සුදුස්සන් තෝරා ගැනීමට අරමුදල ක්‍රියා කර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය ශාඛා කළමනාකරු තනතුරක් ද ඇතුළුව තනතුරු 09 ක් විධිමත් අනුමැතියකින් තොරව තාවකාලික පත්වීම් මගින් සම්පූර්ණ කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදයට අනුව, මුල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා මුල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2013 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2014 ජුනි 30 දිනදීය.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත වියදම් හා සත්‍ය වියදම් අතර සියයට 29 සිට සියයට 2557 දක්වා වු පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය කලමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

### 5.3 අභ්‍යන්තර විගණනය

අරමුදල ආරම්භ කළ දින සිට කළමනාකරු (අභ්‍යන්තර විගණන) තනතුර පුරප්පාඩු ව පැවැති අතර එම අංශයට අනුයුක්ත කර තිබූ නිලධාරින්ද අග්‍රහාර රක්ෂණ අංශයේ ප්‍රතිලාභ ගෙවීම්වල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම වැනි එක් ක්ෂේත්‍රයක කටයුතු පමණක් ආවරණය කරමින් පැවැතුණි. මේ නිසා අරමුදලේ අභ්‍යන්තර විගණනය තව දුරටත් දුර්වලව පැවතුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කර ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(i) රක්ෂණ ප්‍රතිලාභ ගෙවීම
(ii) වත්කම් කළමනාකරණය
(iii) ගිණුම්කරණය
(iv) කාර්ය මණ්ඩල පරිපාලනය
(v) අත්තිකාරම් ලබාදීම